වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

**ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින පහත දැක්වෙන තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් කාර්යශීලි, උද්යෝගිමත් හා විචක්ෂණශීලි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 1. ගණකාධිකාරී (II ශ්‍රේණිය) MM (1-1) - පුරප්පාඩු 01

**රැකියා පිරිවිතරය :-**
බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි ගිණුම් කටයුතු පවත්වාගෙන යාම, අධීක්ෂණයට සහය වීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**
**බාහිර අයදුම්කරුවන් (අ) හෝ (ආ)**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගිණුම්කරණය /වාණිජ්‍යය යන විෂයන්ට ප්‍රමුඛත්වය දෙමින් ලබා ගත් උපාධිය සහ උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයෙහි (ICASL) අන්තර් මධ්‍යම විභාගය සමත් වීම හෝ එක්සත් රාජධානියෙහි වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයෙහි (CIMA) I හා II අදියර විභාග සමත් වී තිබීම සහ වෘත්තීය සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :-**

(අ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි I ශ්‍රේණියෙහි කණිෂ්ඨ කළමනාකරණ තනතුරෙහි වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම.

ඉංග්‍රීසි සහ පරිගණක සාක්ෂරතාවය අත්‍යාවශ්‍ය වේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

## 2. සහකාර අධ්‍යක්ෂ (රසායනාගාර) තනතුර ශ්‍රේණිය II - MM (1-1) - පුරප්පාඩු 01

**රැකියා පිරිවිතරය :-**
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ රසායනාගාරය විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට පහසුකම් සැපයීම සහ එයට පරිපූරක වශයෙන් විශේෂයෙන් පවරනු ලබන පරිදි පවතින සහ නව කර්මාන්ත අවශ්‍යතා සඳහා පරීක්ෂණ ක්‍රමවේදයන් හඳුනාගැනීම, සංවර්ධනය, විකරණය, තහවුරු කිරීම සහ වලංගු කිරීමට අදාළ සියලු තත්ත්ව ක්‍රියාපටිපාටීන් අධීක්ෂණය සහ පරීක්ෂා කිරීම. රසායනාගාර නව ප්‍රමිතීන් / මාර්ගෝපදේශ සැකසීම සහ ප්‍රතීතන ක්‍රියා පටිපාටි සහ යහපත් රසායනාගාර පරිචයට (GLP) සම්බන්ධ අනෙකුත් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීම. පාරිභෝගික පැමිණිලි සඳහා නම් කරන ලද නිලධාරියා සහ ගුණාත්මකභාවය සම්බන්ධ ගැටළු සඳහා උපදේශනය යන විෂය බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ඉටු කිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**
**බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් :-**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, රසායන විද්‍යාව / ක්ෂුද්‍ර ජීව විද්‍යාව එක් විෂයක් ලෙස හදාරමින් ලබාගත් විද්‍යා උපාධිය සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ හෝ පිළිගත්/ ISO 17025 ප්‍රතීතනය ලත් පුද්ගලික අංශයේ සංවිධානයක අවම වශයෙන් අවුරුදු තුනක (03) පළපුරුද්ද (විශ්ලේෂණාත්මක පරීක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

## 3. සහකාර තේ කොමසාරිස් තනතුර - (II ශ්‍රේණිය) MM 1-1 - පුරප්පාඩු 02

**රැකියා පිරිවිතරය :-**
තේ කොමසාරිස්වරයාගේ පාලනය, මග පෙන්වීම හා අධීක්ෂණයට යටත්ව, 1957 අංක 51 හා 1959 අංක 16 දරණ තේ පාලන පනතේ ප්‍රතිපාදන 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ පැවරී ඇති අදාල ක්‍රියාකාරකම් සිදුකිරීම හා 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි 25 වගන්තිය යටතේ නිර්ණය කර ඇති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**
**බාහිර අයදුම්කරුවන් :-**

(අ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය / විද්‍යාව /වාණිජ්‍යය / ආර්ථික විද්‍යාව / රාජ්‍ය පරිපාලන / ව්‍යාපාර පරිපාලනය යන විෂයන්ට මුල්තැන දෙමින් ලබාගත් උපාධිය සහ එම සුදුසුකම් ලැබීමෙන් පසු රාජ්‍ය අංශයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (අ) හෝ (ආ)**

(අ) ශ්‍රී ලංකා තේ මණ්ඩල සේවයේ කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවය

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩල සේවයේ සහකාර තේ කොමසාරිස් II ශ්‍රේණිය තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබා ගැනීම පිණිස පවත්වනු ලබන සීමිත තරග විභාගය සමත් ශ්‍රී ලංකා තේ මණ්ඩල සේවයේ අවම වශයෙන් වසර දහයක (10) ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර ඇති තේ උපදේශක / පරීක්ෂක - කළමනාකරණ සහකාර (තාක්ෂණ) I ශ්‍රේණියේ නිලධාරීන්.

**සැ.යු :-** ඉංග්‍රීසි සහ පරිගණක සාක්ෂරතාවය අත්‍යාවශ්‍ය වේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :-** බාහිර අයදුම්කරුවන් සහ අභ්‍යන්තර (අ) යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්
අභ්‍යන්තර (ආ) යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ලිඛිත විභාගයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**මධ්‍යම කළමනාකරණ (MM 1-1) තනතුරු සඳහා**
**වැටුප් පරිමාණය :-**
MM 1-1 : රු. 91,690/- 10 x රු. 2480 - 15 x රු. 3450 - රු. 168,240/- (මාසිකව)
කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 උපලේඛන II අනුව ආරම්භක මාසික වැටුප් පියවර රු. 71,730/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ. ඒ අනුව ආසන්න වශයෙන් රු. 114,530/- පමණ ආරම්භක මාසික දළ වැටුපක් හිමිවේ.
**වයස් සීමාව :-**
අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

## 4. විශ්ලේෂක තනතුර (JM 1-1) - II ශ්‍රේණිය - තනතුරු පුරප්පාඩු 03

**රැකියා පිරිවිතරය :-**
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ තේ සාම්පල විශ්ලේෂණ කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**
**බාහිර අයදුම්කරුවන් සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්, රසායන විද්‍යාව /ක්ෂුද්‍ර ජීව විද්‍යාව එක් විෂයක් ලෙස හදාරමින් ලබාගත් විද්‍යා උපාධිය සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ හෝ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසරක පළපුරුද්ද ලබා තිබීම. (ISO 17025 ප්‍රතීතන ලත් ආයතනයක)

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

## 5. වෙළඳ ප්‍රචාරණ නිලධාරි (II ශ්‍රේණිය ) තනතුරු (JM 1-1) - තනතුරු පුරප්පාඩු 02

**රැකියා පිරිවිතරය :-**
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ජාත්‍යන්තර හා දේශීය වශයෙන් ප්‍රචාරණයට අවශ්‍ය පරිදි තේ කර්මාන්තය පිළිබඳ වෙළඳපල දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා ප්‍රචාරණ කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**
**බාහිර අයදුම්කරුවන් (I හෝ II)**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් අලෙවිකරණය/ වාණිජ්‍ය/ කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය යන ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛත්වය ලබාදෙමින් ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබාගැනිමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසරක පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) බ්‍රිතාන්‍ය වරලත් අලෙවිකරණ ආයතනයේ පූර්ණ සාමාජිකත්ව (CIM-UK) ලබා තිබීම සහ සුදුසුකම ලබාගැනිමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (I හෝ II)**

(අ) උක්ත බාහිර කාණ්ඩය යටතේ සඳහන් සුදුසුකම් සපුරා තිබීම.

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම සහ අලෙවිකරණය පිළිබඳ පිළිගත් ආයතනයකින් ඩිප්ලෝමාවක් හෝ ඉහළ සුදුසුකමක් ලබා තිබීම.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

## 6. වෙළඳපොල විශ්ලේෂණ තනතුර - II ශ්‍රේණිය (JM 1-1) - පුරප්පාඩු 02

**රැකියා පිරිවිතරය :-**
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ජාත්‍යන්තර හා දේශීය වශයෙන් ප්‍රචාරණයට අවශ්‍ය පරිදි තේ කර්මාන්තය පිළිබඳ වෙළඳපොල දත්ත රැස්කිරීම සහ විශ්ලේෂණය.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**
**බාහිර අයදුම්කරුවන් :-**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආර්ථික විද්‍යාව /වෙළඳ කළමනාකරණය /වාණිජ්‍ය / ව්‍යාපාර කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / කෘෂිකර්මය යන විෂයන්ට ප්‍රමුඛත්වය ලබා දෙමින් උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසරක සේවය කොට තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :-**

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) මට්ටමේ I ශ්‍රේණියෙහි අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සහ පිළිගත් ආයතනයකින් වෙළඳ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහල සුදුසුකමක් සම්පූර්ණ කර තිබෙන නිලධාරියෙකු විය යුතුය.

තනතුර සඳහා ඉංග්‍රීසි සහ පරිගණක හැකියාව අත්‍යාවශ්‍ය වේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්.

## 7. ගිණුම් නිලධාරි (II ශ්‍රේණිය ) JM (1-1) - පුරප්පාඩු 1

**රැකියා පිරිවිතරය :-**
බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි ගිණුම් කටයුතු පවත්වාගෙන යාම, අධීක්ෂණයට සහය වීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**
**බාහිර අයදුම්කරුවන් :-**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගිණුම්කරණය/ වාණිජ්‍ය/ ව්‍යාපාර කළමනාකරණ / රාජ්‍ය පරිපාලනය යන විෂයන් සම්බන්ධව ලබාගත් උපාධිය සහ උපාධිය සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසරක පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයෙහි (ICASL) අන්තර් මධ්‍යම විභාගය සමත් වීම / එක්සත් රාජධානියෙහි වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CIMA) හි I හා II අදියර විභාග සමත් වී තිබීම සහ වෘත්තීය සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :-**

(අ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි I ශ්‍රේණියෙහි කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) තනතුරෙහි වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම සහ එකවර අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් විෂයන් 03 ක් සමත් වී ඇති නිලධාරීන්.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

## 8. සංඛ්‍යාන නිලධාරී JM (1-1) - පුරප්පාඩු 1

**රැකියා පිරිවිතරය :-**
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ තේ කර්මාන්තයට අදාල වන දත්ත විශ්ලේෂණය සහ වාර්තා සකස් කිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**
**බාහිර අයදුම්කරුවන් :-**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, සංඛ්‍යානය / ගණිතය / ආර්ථික විද්‍යාව / වාණිජ්‍ය / ව්‍යාපාර අධ්‍යයනය විෂයක් ලෙස හදාරමින් ලබාගත් ප්‍රථම උපාධිය සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ හෝ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසරක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :-**

(අ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක පළපුරුද්ද සහ පිළිගත් ආයතනයක සංඛ්‍යානය පිළිබඳ ඩිප්ලෝමා හෝ ඊට ඉහල සුදුසුකමක් ලබා තිබීම.

**සටහන :-** පරිගණක සාක්ෂරතාවය සහ ඉංග්‍රීසි දැනුම අත්‍යවශ්‍ය වේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

## 9. රහස්‍ය ලේකම් JM (1-1) - පුරප්පාඩු 1

**රැකියා පිරිවිතරය :-**
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අනෙකුත් පාර්ශවකරුවන් සමග රැස්වීම් සංවිධානය, රැස්වීම්වල සාකච්ඡා සටහන් සකස් කිරීම, කාර්යාලීය ලේකම් තනතුරෙහි සේවා කටයුතු ඉටු කිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**
**බාහිර අයදුම්කරුවන් (I හෝ II)**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබාගැනීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් රහස්‍ය ලේකම් ධුරයක වසරක පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) ශ්‍රී ලංකා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම විසින් පිළිගත් ආයතනයක, ආයතන පරිපාලනය හා ලේකම් පරිචය පිළිබඳ NVQ 6 සුදුසුකමක් ලබා තිබීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් රහස්‍ය ලේකම් ධුරයක වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (I හෝ II)**

(අ) උක්ත බාහිර කාණ්ඩය යටතේ සඳහන් සුදුසුකම් සපුරා තිබීම.

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම සහ ලේකම් පරිචය පිළිබඳ පිළිගත් ආයතනයකින් සහතික පත්‍ර පාඨමාලාවක් ලබා තිබීම.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :-** ලිඛිත පරීක්ෂණයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

ලිඛිත පරීක්ෂණය සඳහා විෂයන් සහ ලකුණු ලබාදීමේ ක්‍රමවේදය හා විභාග මාධ්‍යය

| විෂය | කාලය හා ලකුණු | විභාග මාධ්‍යය |
|---|---|---|
| ✦ භාෂා හැකියාව | (ලකුණු-100) (පැය - ½) | ඉංග්‍රීසි |
| ✦ යෝග්‍යතා පරීක්ෂණය | (ලකුණු-100) (විනාඩි - 45) | සිංහල/දමිල මාධ්‍යය |
| ✦ තනතුරට අදාල විෂය දැනුම | (ලකුණු-100) (පැය - 03) | ඉංග්‍රීසි |

යෝග්‍යතා පරීක්ෂණයට විභාග මාධ්‍යය අයදුම්පත්‍රයේ සඳහන් කර තිබිය යුතු වේ.

ලිඛිත විභාගය සමත්වීම සඳහා එක් විෂයකට අවම වශයෙන් 40% ක් ලකුණු ලබා තිබීම සහ සමස්ථ විභාගයෙන් 50% ක සාමාන්‍යයක් ලබා තිබීම අවශ්‍යය.

**කනිෂ්ඨ කළමනාකරණ (JM 1-1) තනතුරු සඳහා**
**වැටුප් පරිමාණය :-**
JM 1-1 : රු. 72,650 - 10 × රු. 1,360 - 18 × රු. 2,040 - රු. 122,970 (මාසිකව)
කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 උපලේඛන II අනුව ආරම්භක මාසික වැටුප් පියවර රු. 58,615 /- හා රජයේ අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ. ඒ අනුව ආසන්න වශයෙන් රු. 76,415/- පමණ ආරම්භක මාසික දළ වැටුපක් හිමිවේ.
**වයස් සීමාව :-**
අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

## 10. විමර්ශන නිලධාරී තනතුර (MA 5-2) II ශ්‍රේණිය - තනතුරු පුරප්පාඩු 05

**රැකියා පිරිවිතරය :-**
බලය ලත් නිලධාරියෙකුගේ මගපෙන්වීම හා අධීක්ෂණයට යටත්ව 1957 අංක 51 හා 1959 අංක 16 දරණ තේ පාලන පනතේ ප්‍රතිපාදන, 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි 25 වගන්තිය යටතේ නිර්ණය කර ඇති රෙගුලාසි අනුව තේ කර්මාන්තයෙහි සංවර්ධන හා නියාමන කටයුතුවලට අදාල විමර්ශන කටයුතු ඉටු කිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :- (බාහිර සහ අභ්‍යන්තර අයදුම්කරුවන්)**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය / වැවිලි කළමනාකරණය / තේ තාක්ෂණය සහ අගය එකතු කිරීම යන විෂයන් සම්බන්ධයෙන් ලබාගත් ප්‍රථම උපාධිය සහ අදාල ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

## 11. විමර්ශන නිලධාරී (නීති කටයුතු) (MA 5-2) II ශ්‍රේණිය - තනතුරු පුරප්පාඩු 01

**රැකියා පිරිවිතරය :-**
බලය ලත් නිලධාරියෙකුගේ මගපෙන්වීම හා අධීක්ෂණයට යටත්ව 1957 අංක 51 හා 1959 අංක 16 දරණ තේ පාලන පනතේ ප්‍රතිපාදන, 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි 25 වගන්තිය යටතේ නිර්ණය කර ඇති රෙගුලාසි අනුව තේ කර්මාන්තයෙහි සංවර්ධන හා නියාමන කටයුතුවලට අදාල විමර්ශන කටයුතුවලට අදාල නීති කටයුතු ඉටු කිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**
**බාහිර සහ අභ්‍යන්තර අයදුම්කරුවන්**
ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීති උපාධිය සහ අදාල ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස දිවුරුම් දී තිබීම.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**බලාත්මක නිලධාරී (MA 5-2) තනතුරු සඳහා**
**වැටුප් පරිමාණය :-**
MA 5 - II - රු. 62,310 - 10 × රු. 1,360 - 15 × රු. 1,670 - 5 × රු. 2,040 - රු. 111,160 (මාසිකව)
කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 උපලේඛන II අනුව ආරම්භක මාසික වැටුප් පියවර රු. 51,488/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ. ඒ අනුව ආසන්න වශයෙන් රු. 69,288/- පමණ ආරම්භක මාසික දළ වැටුපක් හිමිවේ.
**වයස් සීමාව :-**
අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**වෙනත්/පොදු ප්‍රතිලාභ :-**

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

**පොදු කොන්දේසි :-**

- සියලු අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලු අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදුකරනු ලැබේ.
- සියලු තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාල වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ඇත.
- අභ්‍යන්තර අයදුම්කරුවන් අදාල තනතුරු සඳහා තෝරා ගතහොත් දැනට පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අනුව නියමිත වැටුප් පරිමාණයේ අදාල වැටුප් පියවර මත පිහිටවනු ඇත.

**අයදුම් කිරීම :-**
රජයේ දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ **http:/www.srilankateaboard.lk** වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමඟ **2025 ජූලි 17** වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය**
**574, ගාලු පාර,**
**කොළඹ 3.**